# වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය

කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම,
සමූපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යංශය

# ලංසු සඳහා ආරාධනයයි

**IFB NO.19/UVT/SUP/NCB/W/01**

පහත දැක්වෙන අවශ්‍යතාවයන් ඉටුකර ගැනීම සඳහා යෝග්‍යතා පූර්ණ සහ සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් රත්මලාන, වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

| අංකය | වැඩ විස්තරය | ලංසු සුංරක්ෂණය | ආපසු නොගෙවන මුදල (රු) |
|---|---|---|---|
| 01 | Addition, Alternation and Renovation of the CEC Building (IFB NO.19/UVT/SUP/NCB/W/01) | 180,000.00 | 5,000.00 |

01. ලංසුකරණය ජාතික තරගකාරී ලංසුකරණ පටිපාටිය යටතේ පැවැත්වේ.
02. ඇස්තමේන්තු ගත ව්‍යාපෘති පිරිවැය රුපියල් මිලියන 18 ක් වන අතර මුලු ව්‍යාපෘතිය දින 90ක් ඇතුලත නිමකල යුතුයි.
03. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරු අසාධු ලේඛනගත නොවී සිටිය යුතු අතර සි 6 (C 6) ශ්‍රේණිය සඳහා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි වී සිටිය යුතුය.
04. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට සුදුසුකම් අවශ්‍යතා
    - කොන්ත්‍රාත් වැඩ සඳහා වාර්ෂික පිරිවැටුම් ධාරිතාවය පසුගිය වසර 5 සඳහා අවම වශයෙන් ශ්‍රී ලංකා රුපියල් මිලියන 18 ක් විය යුතුය.
    - පසුගිය වසර 5 ක කාලය ඇතුලත ප්‍රධාන කොන්ත්‍රාත්කරු වශයෙන් රුපියල් මිලියන 20 ක වටිනාකමකින් යුත් මීට සමාන එක් ව්‍යාපෘතියක් වත් මාස 3ක කාලයක් ඇතුලත සාර්ථකව නිමකර තිබීම.
    - ද්‍රවශීලතා වත්කම් හෝ වෙනත් ගිවිසුම්ගත බැඳීම් ණයපහසුකම් වල උපරිම අගය අත්තිකාරම් ගෙවීම් හැර කොන්ත්‍රාත් යටතේ රුපියල් මිලියන 6 නොඉක්ම විය යුතුය.
05. අභිලාෂී ලංසුකරුවන්හට වැඩිදුර තොරතුරු වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ සැපයුම් අංශයෙන් (දුරකථන අංකය - 011-2630733) ලබා ගත හැකි වන අතර, ලංසු ලිපි ලේඛණ 2019.07.04 වන දින සිට 2019.07.24 වන දින දක්වා පෙ.ව. 9.00 සිට ප.ව. 2.00 දක්වා පරීක්ෂා කළ හැක.
06. අභිලාෂී ලංසුකරුවන්හට ලංසු ලිපි ලේඛණ කට්ටලයක් අදාළ ආපසු ගෙවනු නොලබන ගාස්තු ගෙවීමෙන් හා සහකාර මූල්‍යාධිකාරී (සැපයුම්), වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව 2019.07.04 වන දින සිට 2019.07.24 වන දින දක්වා වැඩ කරන දිනයන්හි පෙ.ව 9.00 සිට ප.ව. 2.00 දක්වා ලබාගත හැක.
07. අනුපිටපතකින් යුතු ලංසු (මුල් පිටපත හා අනු පිටපත) 2019.07.25 වන දින ප.ව. 2.00ට පෙර සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය, අංක 100, කඳවල රත්මලාන යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් හෝ විශ්වවිද්‍යාලීය සැපයුම් අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටිය තුල තැන්පත් කළ යුතුය. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරෙහි "ප්‍රසම්පාදන අංකය, ප්‍රසම්පාදනයේ විස්තර, ලංසුපත් විවෘත කිරීමේ දිනය" සඳහන් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.
08. ලංසු ඇපකර ශ්‍රී ලංකා මහා බැංකුව විසින් අනුමත කරන ලද ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වානිජ බැංකුවකින් ලබාගත යුතු අතර එහි වලංගු කාලය 2019.11.06 දක්වා විය යුතුය.
09. ඕනෑම අවස්ථාවක ඇති එක් ලංසුවක් හෝ ලංසු කිහිපයක් හෝ ලංසු සියල්ල භාර ගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ හිමිකම විශ්වවිද්‍යාල ප්‍රසම්පාදන කමිටුව සතුය.

සභාපති,
ප්‍රසම්පාදන කමිටුව,
වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය,
අංක 100,
කඳවල,
රත්මලාන.

Tel: 0112630733
Fax: 0112630738
Web: www.univotec.ac.lk

2019 ජූලි 04